නිදහස් මාධ්‍ය ව්‍යාපාරය
சுதந்திர ஊடக இயக்கம்
FMM SRI LANKA Free Media Movement


# මාධ්‍ය නිදහසඃ නිරීක්ෂණ වාර්තාව

## ஊடக சுதந்திரம்: கண்காணிப்பு அறிக்கை

## Media Freedom Rights Monitoring Report

MFRMD

2021 ඔක්තෝබර්-නොවැම්බර් කලාප අංක 10-11



මහාචාර්ය බුද්ධි මාරඹේ කෘෂිකර්ම අමාත්‍යාංශයෙහි දැරූ තනතුරුවලින් ඉවත් කිරීම



අරුණ පුවත්පතේ කර්තෘ මහින්ද ඉලේපෙරුම ප්‍රශ්න කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවීම



මාධ්‍යවේදී විශ්වලිංගම් විශ්වචන්ද්‍රන් ප්‍රහාරයකට ලක් වීම

මාධ්‍ය නිදහසට අදාළව ඒ ඒ මාසය තුළ වාර්තා වන සිදුවීම්, පූර්ව සිදුවීම්වලට අදාළ වර්ධනයන් හා ඒවාට අදාළ නිරීක්ෂණ මෙම වාර්තාවට ඇතුළත් වේ. මාධ්‍යවේදීන්ගේ මෙන්ම ජනතාවගේ භාෂණයේ හා අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සම්බන්ධ සිදුවීම්, නව නීති පැනවීම් හා ජාත්‍යන්තර ප්‍රජාව දක්වන ප්‍රතිචාර කෙරෙහිද මෙහිදී අවධානය යොමු කෙරේ. මාධ්‍ය නිදහස පිළිබඳව නිරීක්ෂණය කිරීම සඳහා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය තෝරා ගෙන ඇති විෂය පථයට/ සංරචකයන්ට අදාළ සිදුවීම් 20ක් 2021 ඔක්තෝබර්-නොවැම්බර් දෙමස තුළ නිරීක්ෂණය විය. ඉන් බහුතරයක් අදහස් පළ කිරීමේ නිදහසට එරෙහිව රජය විසින් ඍජුව හා වක්‍රව ගනු ලැබූ ක්‍රියාමාර්ග වන අතර, මාධ්‍යවේදීන්ට අමතරව රාජ්‍ය නිලධාරීන්, විශේෂඥ මත ප්‍රකාශ කරන්නන් හා ආගමික නායකයින්ගේ අදහස් පළ කිරීම්වලට එරෙහිවද දැඩි ක්‍රියාමාර්ග ගැනීම් නිරීක්ෂණය විය. සාපරාධී අපහාසය නීති පොතෙන් ඉවත් කර තිබියදීත්, ඇමතිවරුන් හා ප්‍රබල නිලධාරීන්ගේ පැමිණිලි මත විවිධ පුද්ගලයන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා ප්‍රශ්න කිරීමේ ප්‍රවණතාවක් පසුගිය දෙමස තුළ සිදුවීම්වලින් මෙන්ම සැප්තැම්බර් මාසයේදී පුවත්පත් කතුවරුන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවීමෙන් ද පෙන්නුම් කරයි. මාස 18ක් තිස්සේ චෝදනා ඉදිරිපත් කිරීමකින් තොරව රඳවාගෙන සිටි අහ්නාෆ් ජසීම් කවියා අධිකරණයට ඉදිරිපත් කිරීම සාධනීය පියවරක් වන නමුත් එහිදීද පොලිසිය ඔහුගේ අයිතිවාසිකම් බරපතළ ලෙස උල්ලංඝනය වන ආකාරයට කටයුතු කර තිබේ. කින්නියා ප්‍රදේශයේ උද්ඝෝෂණයක් වාර්තා කිරීමට ගිය මාධ්‍යවේදීන් තිදෙනෙකුට උද්ඝෝෂකයන් අතර සිටි කිසියම් පිරිසක් විසින් පහර දීමේ සිද්ධිය හෙළා දකිමින් නිදහස් මාධ්‍ය ව්‍යාපාරය නිවේදනයක් නිකුත් කළේය.

## ඔක්තෝබර්-නොවැම්බර් දෙමස තුළ වාර්තා වූ සිදුවීම්

1. ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය විසින් හඳුන්වා දෙන ලද ජනමාධ්‍ය ආචාරධර්ම පද්ධතියට වසර 40ක් සපිරීම නිමිත්තෙන් පැවති සම්මන්ත්‍රණයකදී කතුවරයකු විසින් කරන ලද ප්‍රකාශයක් මාධ්‍ය සමාජය තුළ ආන්දෝලනයට ලක් වීම.
2. සාමූහික ප්‍රයත්නයකින් නවීන හා නූතන සමාජයට ගැළපෙන මාධ්‍ය ආචාරධර්ම පද්ධතියක් සකස් කළ යුතු බවට ජනමාධ්‍ය ඇමතිවරයා කළ ප්‍රකාශය.
3. ජනමාධ්‍යවේදීන් සඳහා 'ශ්‍රී ලංකා වරලත් ජනමාධ්‍යවේදී ආයතනය' නමින් නව ආයතනයක් පිහිටුවීම සඳහා ජනමාධ්‍ය ඇමති ඩලස් අලහප්පෙරුම ඉදිරිපත් කළ යෝජනාවකට කැබිනට් අනුමැතිය හිමි වීම.
4. පාර්ලිමේන්තු මන්ත්‍රී චම්පික රණවකගේ වට්ස්ඇප් සංවාදවලට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව රහසේ සවන් දී ඇති බවට මන්ත්‍රීවරයා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශයක් කිරීම.
5. 'පරිසර හිතකාමී කෘෂිකර්මාන්තය පිළිබඳ රජයේ ප්‍රතිපත්ති තීරණය' පිළිබඳව සිය විශේෂඥ මතය පළ කිරීම හේතුවෙන් මහාචාර්ය බුද්ධි මාරඹේ කෘෂිකර්ම අමාත්‍යාංශයෙහි දැරූ තනතුරුවලින් ඉවත් කිරීම.
6. 'සතිඅග අරුණ' පුවත්පතේ ඔක්. 23 වැනිදා ප්‍රධාන පුවත සම්බන්ධයෙන් ප්‍රකාශයක් ලබා ගැනීම සඳහා එම පුවත්පතේ කර්තෘ මහින්ද ඉලේපෙරුම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවීම
7. ලසන්ත වික්‍රමතුංග ඝාතනය ඇතුළුව මාධ්‍යවේදීන් තිදෙනෙකුගේ ඝාතන සම්බන්ධයෙන් 'මාධ්‍යවේදී ඝාතනයන් පිළිබඳ නිත්‍ය මහජන අධිකරණය' විසින් ආරම්භ කෙරෙන නඩු විභාගයේ සමාරම්භක සැසිය නෙදර්ලන්තයේ හේග් නුවරදී පැවැත්වීම.
8. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ මාස 3කට අධික කාලයක් තිස්සේ රඳවාගෙන සිටින, ලංකා ඊ නිව්ස් වෙබ් අඩවියේ මාධ්‍යවේදී කීර්ති රත්නායක වෙනුවෙන් ශ්‍රේෂ්ඨාධිකරණයෙහි මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කිරීම.
9. කෝට්ටේ නගරසභාවේ බලධාරීන්ගේ පැමිණිල්ලක් මත New Citizen වෙබ් මාධ්‍ය ජාලයේ මාධ්‍යවේදියකු වන සියත් මෙන්ඩිස් වැලිකඩ පොලිසිය විසින් අත්අඩංගුවට ගැනීම.
10. මතභේදයට හේතු වී ඇති චීන පොහොර තොගය ගැන පළ කළ ප්‍රවෘත්ති හේතුවෙන් අපකීර්තියක් සිදු වූ බව හා ඒ පිළිබඳ නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බවට අනතුරු අඟවමින්, අදාළ පොහොර ආනයනකරු සිරස මාධ්‍ය ජාලයට ලිපියක් යොමු කිරීම.
11. සමාජ මාධ්‍ය ඔස්සේ රජය හෝ රජයේ ප්‍රතිපත්ති විවේචනය කරන රාජ්‍ය සේවකයන්ට එරෙහිව විනය පියවර ගන්නා බවට ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා රාජ්‍ය සේවයකයින් වෙත ලිපියක් යොමු කිරීම.
12. කාව්‍ය සංග්‍රහයක් ලියා පළ කිරීම හේතුවෙන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගෙන මාස 18ක් තිස්සේ රඳවා තබා සිටි අහ්නාෆ් ජසීම් අධිකරණයට ඉදිරිපත් කිරීම.
13. 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත නැවත සමාලෝචනය කිරීම සඳහා පත් කළ නිලධාරී කමිටුවේ වාර්තාව ජනාධිපතිවරයා වෙත පිළිගැන්වීම.
14. කොතලාවල පනතට එරෙහිව පාර්ලිමේන්තු වටරවුමේ පැවති උද්ඝෝෂණයේදී අත්අඩංගුවට ගත් විරෝධතාකරුවන් 5 දෙනාට දින 105කට පසුව ඇප නියම වීම.
15. සමාජ ජාල ඔස්සේ අදහස් ප්‍රකාශ කිරීම නිසා අයුක්තිසහගත ලෙස අත්අඩංගුවට ගැනීමෙන් තම මූලික අයිතිවාසිකම් කඩ වූ බව සඳහන් කරමින් සමාජ ක්‍රියාකාරිකයකු වන චිරන්ත රන්මාල් අමරසිංහ ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කිරීම.
16. උතුරේ යුද්ධය හේතුවෙන් මියගිය හා අතුරුදන්වූවන් වෙනුවෙන් සැමරුම් උත්සව පැවැත්වීම වළක්වාලමින් පුද්ගලයන් 8 දෙනෙකුට එරෙහිව වවුනියාව මහේස්ත්‍රාත්වරයා තහනම් නියෝගයක් නිකුත් කිරීම හා පසුව එම නියෝගය සංශෝධනය කිරීම.
17. බලහත්කාරයෙන් නිරෝධායනයට යැවීමෙන් සිය මූලික අයිතිවාසිකම් කඩ වූ බවට ලංකා ගුරු සංගමයේ ලේකම් ජෝසප් ස්ටාලින් ගොනු කළ මූලික අයිතිවාසිකම් පෙත්සම ශ්‍රේෂ්ඨාධිකරණය නිෂ්ප්‍රභ කිරීම.
18. පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් කළ ප්‍රකාශයක් පිළිබඳව රාජ්‍ය බුද්ධි අංශ ප්‍රධානියා විසින් කරන ලද පැමිණිල්ලකට අනුව කොළඹ අගරදගුරු පදවියේ මාධ්‍ය ප්‍රකාශක, ආචාර්ය සිරිල් ගාමිණී පියතුමා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා ප්‍රශ්න කිරීම.
19. නොවැ. 23 වැනිදා කින්නියාහි පාලම් පාරුවක් පෙරළීමෙන් 6 දෙනෙකු මියයෑමේ සිද්ධියට එරෙහි විරෝධතා වාර්තා කිරීමට ගිය මාධ්‍යවේදීන් තිදෙනෙකු, උද්ඝෝෂකයින් අතර සිටි කිසියම් පිරිසකගේ ප්‍රහාරයට ලක් වීම.
20. ලංකාශ්‍රී මාධ්‍ය ආයතනයේ මුලතිව් හි මාධ්‍යවේදියෙකු වන විශ්වලිංගම් විශ්වචන්ද්‍රන් මුල්ලිවයික්කාල් ප්‍රදේශයේ වාර්තාකරණයක නිරතව සිටියදී හමුදා භටයන්ගේ ප්‍රහාරයකට ලක් වීම.

1 වගුව: වාර්තා වූ සමස්ත සිදුවීම් - 2021 ඔක්තෝබර් - නොවැම්බර්

| අංකය | ආවරණය කර ඇති සංරචකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ආරක්ෂාව සහ සුරක්ෂිතබව | 08 |
| 02 | නීතිමය කොන්දේසි | 09 |
| 03 | වෘත්තීයවේදීත්වය | 03 |
| | **එකතුව** | **20** |

## ආරක්ෂාව සහ සුරක්ෂිතබව

**මාධ්‍යවේදීන්ට තම වෘත්තිය ශාරීරික සහ මානසික ඒකාග්‍රතාවකින් යුක්තව නිදහස් ලෙස කර ගෙන යෑමේ වාතාවරණයක් පැවතීම ජනමාධ්‍ය නිදහස පිළිබඳ මූලික කොන්දේසියකි. එමෙන්ම ජනමාධ්‍ය නිදහස හා අදහස් පළ කිරීමේ නිදහස ආරක්ෂා වීමට නම්, පුරවැසියන්ට අනිටු ප්‍රතිවිපාකවලට මුහුණදීමේ අවදානමකින් තොරව ජනමාධ්‍ය ඔස්සේ හෝ වෙනත් ආකාරවලින් නිදහසේ අදහස් පළ කළ හැකි වාතාවරණයක් පැවතිය යුතුය. සාමාකාමීව රැස්වීමේ, විරෝධය පළ කිරීමේ හා උද්ඝෝෂණවල නිරත වීමේ නිදහසද අදහස් පළ කිරීමේ නිදහසට අයත් වේ. මෙම මූලික නිදහස උල්ලංඝනය වූ අවස්ථා 8ක් ඔක්තෝබර් - නොවැම්බර් මාසවලදී දී වාර්තා විය. සාපරාධී අපහාස නීතිය නීති පොතෙන් ඉවත් කර තිබියදීත්, එය බලාත්මකව පැවති සමයේ මෙන් ඇමතිවරයකුගේ පැමිණිල්ලක් මත පුවත්පත් කතුවරුන් හා මාධ්‍යවේදීන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවීමේ සිදුවීමක් සැප්තැම්බර් මාසයේදී වාර්තා වූ අතර, ඔක්තෝබර් මාසයේදී ජනාධිපති ලේකම්වරයාගේ පැමිණිල්ලක් මත අරුණ පුවත්පතේ කතුවරයාද නොවැම්බර් මාසයේදී රාජ්‍ය බුද්ධි අංශ ප්‍රධානියාගේ පැමිණිල්ලක් මත ප්‍රමුඛ පෙළේ ආගමික නායකයකු වූ සිරිල් ගාමිණී පියතුමාද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවන ලදි. විශේෂඥ මතයක් පළ කළ මහාචාර්ය බුද්ධි මාරඹේ තනතුරුවලින් ඉවත් කිරීම, සමස්ත රාජ්‍ය සේවකයන්ගේ අදහස් පළ කිරීමේ නිදහසට බලපෑම් කරන නිල ලිපියක් නිකුත් කිරීම ආදියද අදහස් පළ කිරීමේ නිදහස මර්දනය කරන උත්සාහයන් ලෙස නිරීක්ෂණය වේ.**

2 වගුව: 2021 ඔක්තෝබර් - නොවැම්බර්: ආරක්ෂාව සහ සුරක්ෂිතබව - සිදුවීම් 08

| අංකය | දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | පහරදීම | 02 |
| 02 | මානසික බලපෑම් | 06 |
| | **එකතුව** | **08** |

1. **පාර්ලිමේන්තු මන්ත්‍රී චම්පික රණවකගේ වට්ස්ඇප් සංවාදවලට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව රහසේ සවන් දී ඇති බවට මන්ත්‍රීවරයා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශයක් කිරීම.**

   තමා පසුගිය රජයේ ඇමතිවරයකු ලෙස සිටියදී අධිකරණයේ අවසරයකින් තොරව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සිය දුරකථන සංවාදවලට රහසේ සවන් දී ඇති බවත් එය මන්ත්‍රීවරයකු ලෙස සිය වරප්‍රසාද කඩ කිරීමක් මෙන්ම නීති විරෝධී ක්‍රියාවක් බවත් ඔක්තෝබර් 21 වැනිදා පාර්ලිමේන්තුව හමුවේ විශේෂ ප්‍රකාශයක් කරමින් පා.ම. පාඨලී චම්පික රණවක ප්‍රකාශ කළේය. ඔහු කතානායකවරයාගෙන් ඉල්ලා සිටියේ අදාළ නිලධාරීන් පාර්ලිමේන්තු වරප්‍රසාද කමිටුව හමුවට කැඳවා ප්‍රශ්න කරන ලෙසයි.

   ප්‍රකාශයක් ලබා දීමට එහි ගිය අවස්ථාවේදී නිලධාරීන්ගෙන් මේ පිළිබඳ අනාවරණය වූ බවද එම සංවාදවල පිටපත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ප්‍රසාද් රණසිංහ විසින් අදාළ නිලධාරීන්ට ලබා දී ඇති බව ද ඔහු ප්‍රකාශ කළේය. මෙම සංවාද වට්සැප් හරහා සිදුකෙරුණු ඒවා බැවින් සාමාන්‍ය ඇමතුම්වලට සවන්දෙන ආකාරයට ඒවාට සවන් දීමට නොහැකි බවත් එම ඇමතුම්වලට සවන් දුන්නේ කුමන තාක්ෂණයකින්ද, එම තාක්ෂණය ලැබුණේ කොහෙන්ද යන්න විමර්ශනය කරන ලෙසත් මන්ත්‍රීවරයා වැඩිදුරටත් පැවසීය. ආන්දෝලනයට ලක්ව ඇති Pegasus ඔත්තු මෘදුකාංගය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සතුව තිබේදැයි මන්ත්‍රීවරයා ප්‍රශ්න කළේය.

   Pegasus යනු ඊශ්‍රායල සයිබර් අවි සමාගමක් වන

NSO සමූහය විසින් වැඩි දියුණු කරන ලද ඔත්තු මෘදුකාංගයක් වන අතර එය IOS සහ Android ජංගම දුරකථන (සහ වෙනත් උපාංග) මත රහසිගතව ස්ථාපනය කළ හැක. 2016 වන විට, Pegasus ඔත්තු මෘදුකාංගයට කෙටි පණිවිඩ කියවීමට, ඇමතුම් ලුහුබැඳීමට, මුරපද එකතු කිරීමට, ස්ථාන ආවේක්ෂණයට, ඉලක්ක උපාංග යේ මයික්‍රොෆෝනය සහ කැමරාවට ප්‍රවේශ වීමට සහ යෙදුම්වලින් තොරතුරු රැස් කිරීමට හැකියාව තිබුණි.

(මූලාශ්‍රය: විකිපීඩියා [Pegasus (spyware)](Pegasus (spyware)) පිටුව)

මෙම ඔත්තු මෘදුකාංගය සම්බන්ධයෙන් සිවිල් සංවිධාන හා විවිධ වෘත්තිකයින් 99 දෙනෙකු විසින් අත්සන් කළ පෙත්සමක් සැප් 30 දින එක්සත් ජාතීන්ගේ 46 වන සැසිවාරයේදී මානව හිමිකම් කවුන්සිලය වෙත Accessnow සංවිධානය විසින් භාර දෙන ලදි. පෙත්සම්කරුවන්ගේ ප්‍රධාන ඉල්ලීම වූයේ Pegasus ආවේක්ෂණ තාක්ෂණය විකිණීම, අපනයනය, මාරු කිරීම සහ භාවිතය මගින් පහසුකම් සපයා සිදුකරනු ලබන මානව හිමිකම් උල්ලංඝන තත්ත්වයන් පිළිබඳ ස්වාධීන පරීක්ෂණයක් කඩිනමින් පවත්වා එම අනීත්‍යානුකූල ඔත්තු බැලීම වැළැක්වීම පිණිස පුළුල් ක්‍රියාමාර්ග ගත යුතු බවයි.

මූලාශ්‍රය: 1. https://anidda.lk

2. හැන්සාඩ් වාර්තාව 2021-10-21

2. **පරිසර හිතකාමී කෘෂිකර්මාන්තය පිළිබඳ රජයේ ප්‍රතිපත්ති තීරණය සම්බන්ධයෙන් සිය විශේෂඥ මතය පළ කිරීම හේතුවෙන් මහාචාර්ය බුද්ධි මාරඹේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ දැරූ සියලු තනතුරුවලින් ඉවත් කිරීම.**

ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්ති සම්පාදන කමිටුවේ සාමාජිකයකු, කෘෂි නව්‍යකරණ ව්‍යාපෘතියේ මෙහෙයුම් කමිටුවේ සාමාජිකයකු හා කුඩා ව්‍යාපාර කෘෂි සහභාගීත්ව වැඩසටහනේ උපදේශක වරයකු ලෙස කටයුතු කළ මහාචාර්ය බුද්ධි මාරඹේ, කෘෂිකර්ම ඇමතිවරයාගේ නියෝගය පරිදි එම සියලු තනතුරුවලින් ඉවත් කළ බව ඔක්තෝබර් 26 වැනිදා කෘෂිකර්ම අමාත්‍යාංශය නිවේදනය කළේය.

මහාචාර්යවරයා, වත්මන් රජය ප්‍රතිපත්තිමය තීන්දුවක් මත ක්‍රියාත්මක කරන පරිසර හිතකාමී කෘෂිකර්මාන්තය විවේචනය කරමින්, ඊට එරෙහිව විශ්වවිද්‍යාල ප්‍රජාව, ප්‍රජා සංවිධාන හා සාමාන්‍ය ජනතාව පෙළ ගැස්වෙන ආකාරයේ ප්‍රකාශන සිදු කළ බවට එම ලිපියෙන් චෝදනා කොට තිබේ.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිවිද්‍යා පීඨයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු වන බුද්ධි මාරඹේ, කාබනික කෘෂිකර්මාන්තය පිළිබඳ ප්‍රමුඛ පෙළේ පර්යේෂකයකු හා ප්‍රාමාණික විද්වතකු ලෙස සැලකෙන අතර, 'විද්‍යාත්මක දැනුම උපයෝගි කරගෙන කිසියම් දෙයක් ශාස්ත්‍රීය ලෙස විග්‍රහ කිරීම මිස පදනමක් නොමැතිව කිසිවක් විවේචනය නොකළ බව' තනතුරුවලින් ඉවත් කිරීමෙන් පසු lankasara වෙබ් අඩවිය වෙත අදහස් දක්වමින් ඔහු ප්‍රකාශ කර තිබේ.

මූලාශ්‍රය: 1. https://www.newsfirst.lk

2. https://lankasara.com

3. **'සතිඅග අරුණ' පුවත්පතේ ඔක්. 24 වැනිදා ප්‍රධාන පුවත සම්බන්ධයෙන් ප්‍රකාශයක් ලබා ගැනීම සඳහා එම පුවත්පතේ කර්තෘ මහින්ද ඉලේපෙරුම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවීම**

''ඉන්දියානු පොහොරවලට ගෙවන්න කෝටි 29ක් පුද්ගලික ගිණුමකට - ජනාධිපති ලේකම් පී.බී. ජයසුන්දර බලපෑම් කරලා'' මැයෙන් නොවැම්බර් 24 වැනිදා 'සති අග අරුණ' පුවත්පතේ පළ වූ පුවත සම්බන්ධයෙන් ජනාධිපති ලේකම්වරයා විසින් සිදු කරන ලද පැමිණිල්ලකට අනුව, එම පුවත්පතේ කර්තෘ මහින්ද ඉලේපෙරුම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා ප්‍රශ්න කෙරිණි. එම වාර්තාව සාවද්‍ය හා ද්වේශසහගත බවත් ඒ සම්බන්ධයෙන් සියලු පාර්ශ්ව කැඳවා විධිමත් පුළුල් පරීක්ෂණයක් වහාම පවත්වන්නැයි ජනාධිපති ලේකම්වරයා පොලිස්පතිවරයාට දැනුම් දී තිබෙන බවත් ජනාධිපති මාධ්‍ය අංශය නිවේදනයක් නිකුත් කරමින් ප්‍රකාශ කළේය. මෙම පුවතට මූලාශ්‍රය වූයේ විජිත හේරත් මන්ත්‍රීවරයා පාර්ලිමේන්තුවේදී කළ ප්‍රකාශයකි. මේ සම්බන්ධයෙන් මාධ්‍ය වාර්තා බොහෝ ගණනක් පළ වූ නමුත් අරුණ පුවත්පතේ කතුවරයාගෙන් පමණක් ප්‍රශ්න කිරීම විශේෂත්වයකි. නොවැ. 9 වැනිදා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශයක් කළ විජිත හේරත් මන්ත්‍රීවරයා, අරුණ කතුවරයා කැඳවා කළ පරීක්ෂණයේ වාර්තාව හැකි නම් ප්‍රසිද්ධ කරන ලෙස අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට අභියෝග කළේය.

මූලාශ්‍රය: 1. http://sinhala.adaderana.lk

2. https://www.newsfirst.lk

4. **මතභේදයට හේතු වී ඇති චීන පොහොර තොගය ගැන පළ කළ ප්‍රවෘත්ති හේතුවෙන් අපකීර්තියක් සිදු වූ බව හා ඒ පිළිබඳ නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බවට අනතුරු අඟවමින්, අදාළ පොහොර ආනයනකරු සිරස මාධ්‍ය ජාලයට ලිපියක් යොමු කිරීම.**

අහිතකර බැක්ටීරියා ඇති බව තහවුරු කරමින් ජාතික ශාක නිරෝධායන සේවය විසින් ප්‍රතික්ෂේප කරන ලද චීන පොහොර තොගයේ අපනයනකරු වන 'චින්ඩාවෝ සීවින් බයෝටෙක්' සමාගම අදාළ අර්බුදය සම්බන්ධයෙන් සිරස මාධ්‍ය ජාලය වෙත නොවැම්බර් 7 වැනිදා ලිපියක් යොමු කරමින් සාවද්‍ය විද්‍යාත්මක පරීක්ෂණ වාර්තා නිකුත් කරන පාර්ශ්වයට සහ පරීක්ෂණ ප්‍රතිඵල සාවද්‍ය ලෙස ප්‍රචාරය කරන මාධ්‍යවලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට තමන්ට අයිතියක් ඇති බවට අනතුරු ඇඟවීමක් සිදු කර තිබේ.

“ශ්‍රී ලංකාව ගිවිසුම්වලට ගරු නොකිරීම සහ එහි ජනතාව නොමග යැවීම තේරුම්ගත නොහැකි බවත්, චීන සමාගමක් ශ්‍රී ලංකාවට හානිකර ක්ෂුද්‍ර ජීවීන් අඩංගු කාබනික පොහොර අපනයනය කළ බවට වන අසත්‍ය වාර්තාව සත්‍යය නොදන්නා බොහෝ මිනිසුන් සහ පාරිභෝගිකයින් නොමග යවා අපනයන ව්‍යවසායන් තුළ සාධාරණ වෙළඳාමට විශාල බාධාවක්” කර ඇති බවත් එම ලිපියෙන් ප්‍රකාශ කර ඇත.

පොහොර තොගය පිළිබඳ ගැටලුව මාධ්‍ය ඔස්සේ සාකච්ඡාවට ලක් වීම හා අදාළ රජයේ ආයතනවල නිලධාරීන් සෘජුව කටයුතු කිරීම නිසා මෙම ගනුදෙනුවට සම්බන්ධ පාර්ශ්වවල අපේක්ෂා පසුබෑමට ලක් වූ අතර මෙම ලිපිය එම මාධ්‍ය භූමිකාවට ප්‍රතිචාරයක් ලෙස සැලකිය හැකිය. පොහොර තොගය ප්‍රතික්ෂේප කිරීම නිසා සිදු වූ පාඩුව වෙනුවෙන් ඇමරිකානු ඩොලර් මිලියන 08ක් වන්දි ඉල්ලා අදාළ සමාගම ශාක නිරෝධායන ඒකකයේ සහකාර අධ්‍යක්ෂ වෙත එන්තරවාසියක් යවා ඇත.

මූලාශ්‍රය: 1. https://www.youtube.com
2. https://divaina.lk

5. **සමාජ මාධ්‍ය ඔස්සේ රජය හෝ රජයේ ප්‍රතිපත්ති විවේචනය කරන රාජ්‍ය සේවකයන්ට එරෙහිව ආයතන සංග්‍රහය යටතේ විනය පියවර ගන්නා බවට ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා රාජ්‍ය සේවකයින් වෙත ලිපියක් යොමු කිරීම.**

කිසියම් රාජ්‍ය සේවකයකු, සමාජ මාධ්‍ය හෝ වෙනත් ආකාරයට, ආයතනය තුළ හෝ පරිබාහිර ස්ථානවලදී රජයේ තීරණ හෝ ක්‍රියාමාර්ග සම්බන්ධ විවේචන කිරීම, සමච්චලයක් හෝ උපහාසයක් ඇති වන ලෙස අදහස් පළ කිරීම හේතුවෙන් ආයතන සංග්‍රහයේ සඳහන් ආකාරයෙන් විනය විරෝධී සහ තනතුරට නොගැළපෙන ලෙස කටයුතු කිරීම යන වරද සඳහා චූදිතයකු බවට පත්කළ හැකි බව එම ලිපියෙන් අවධානයට ලක්කර තිබේ.

ස්වදේශ කටයුතු අමාත්‍යංශයේ ලේකම්වරයා වෙනුවෙන්, අතිරේක ලේකම් විමර්ශන - ධම්මික මුතුගල විසින් මෙම ලිපිය යොමු කර ඇත. රාජ්‍ය සේවයේ කටයුතු කරන නිලධාරීන් මේ සම්බන්ධ දැනුවත් කරන ලෙස එමගින් දිස්ත්‍රික් ලේකම්වරුන්ට දැනුම් දී ඇත.

මෙම ලිපිය පිළිබඳව අධ්‍යාපන හා සෞඛ්‍ය ක්ෂේත්‍රවල ප්‍රමුඛ වෘත්තීය සමිති නායකයින් විරෝධය පළ කර තිබේ. රජය විවේචනය කිරීම හා මාධ්‍යයට අදහස් දැක්වීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන උපුටා දක්වමින් සෞඛ්‍ය ලේකම්වරයා විසින් සෞඛ්‍ය කාර්ය මණ්ඩල සඳහා මීට පෙර යොමු කෙරුණු මෙබඳු ලිපියක් මානව හිමිකම් ආරක්ෂකයින්ගේ දැඩි විවේචනයට ලක් වූ අතර, අදහස් පළ කිරීමේ නිදහස සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇති විධිවිධාන ආයතන සංග්‍රහයට ඉහළින් බලපවත්වන බව එහිදී අවධාරණය කෙරිණි.

මූලාශ්‍ර: 1. https://www.lankaviews.com
2. https://theleader.lk

6. **පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් කළ ප්‍රකාශයක් පිළිබඳව රාජ්‍ය බුද්ධි අංශ ප්‍රධානියා විසින් කරන ලද පැමිණිල්ලකට අනුව කොළඹ අගරදගුරු පදවියේ මාධ්‍ය ප්‍රකාශක, ආචාර්ය සිරිල් ගාමිණී පියතුමා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා ප්‍රශ්න කිරීම.**

පාස්කු ප්‍රහාරයට සම්බන්ධ සහරාන්ට රාජ්‍ය බුද්ධි අංශ පඩි ගෙවූ බවට සිරිල් ගාමිණී පියතුමන් කළ ප්‍රකාශයකින් තමන්ට අපහාසයක් සිදු වූ බවට රාජ්‍ය බුද්ධි සේවයේ ප්‍රධානී, මේජර් ජනරාල් සුරේෂ් සලේ විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කළ පැමිණිල්ලකට අදාළව පියතුමන් දින තුනක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හමුවට කැඳවා ප්‍රශ්න කෙරිණි.

පළමු කැඳවීම ලැබූ අවස්ථාවේ, තමන් අත්අඩංගුවට ගැනීම වළක්වන ලෙස ඉල්ලමින් පියතුමා ශ්‍රේෂ්ඨාධිකරණය හමුවටගිය අතර, එවැනි අත්අඩංගුවට ගැනීමක් නොකරන බවට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙනුවෙන් නීතිපතිවරයා අධිකරණයේදී සහතික විය. ඒ අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණි පියතුමා පළමු දෙවතාවේදී පැය අටකට වැඩි කාලයක් රඳවාගෙන ප්‍රශ්න කරන ලදි.

නොවැම්බර් 22 වැනිදා තෙවන වරට ප්‍රශ්න කිරීම සඳහා පියතුමන් කැඳවූ අවස්ථාවේ කතෝලික පියතුමන්ලා රැසක් විරෝධතා පුවරු රැගෙන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඉදිරිපිටට පැමිණ නිහඬ විරෝධයක නිරත වූහ.

මූලාශ්‍රය: https://www.lankaviews.com

7. **නොවැ. 23 වැනිදා කින්නියා කලපුවේදී පාලම් පාරුවක් පෙරළීමෙන් 6 දෙනෙකු මියයෑමේ සිද්ධියට එරෙහි විරෝධතා වාර්තා කිරීමට ගිය මාධ්‍යවේදීන් තිදෙනෙකු, උද්ඝෝෂකයින් අතර සිටි කිසියම් පිරිසකගේ ප්‍රහාරයට ලක් වීම.**

ත්‍රිකුණාමලයයේ කින්නියා ප්‍රදේශයේ බුහාරි මංසන්ධිය අසලදී මෙම ප්‍රහාරය එල්ල වී ඇති අතර එහිදී ලේක්හවුස් ආයතනයේ තිනකරන් පුවත්පතේ මාධ්‍යවේදී අබ්දුල් සලාම් මොහොම්මදු යාසිම්ට පහර දුන් පිරිස ඔහුගේ වාර්තාකරණ දත්ත ඇතුළත් ස්මාර්ට් ජංගම දුරකථනය පැහැරගෙන තිබේ. ඔහු මේ සම්බන්ධව අංක CIB (1) 10/291 යටතේ කින්නියා පොලිස් ස්ථානයේ පැමිණිල්ලක් ගොනු කර ඇත.

යාසිම්ට පහර දෙන අවස්ථාවේ ශක්ති නිව්ස් ෆස්ට් වාර්තාකරු එච්. එම් හලාල්ඩීන්ට සහ තිනකරන් මාධ්‍යවේදී ඒ. එල්. එම් රෆායිඩීන්ටද පහර දී වාර්තාකරණය අවහිර කර පලවා හැර ඇත.

මූලාශ්‍රය: https://yukthiya.lk

8. **ලංකාශ්‍රී මාධ්‍ය ආයතනයේ මුලතිව් හි මාධ්‍යවේදියෙකු වන විශ්වලිංගම් විශ්වචන්ද්‍රන් මුල්ලිවයික්කාල් ප්‍රදේශයේ වාර්තාකරණයක නිරතව සිටියදී හමුදා භටයන්ගේ ප්‍රහාරයකට ලක් වීම.**

   නොවැම්බර් 27 වැනිදා පෙරවරුවේ, මහාමාර්ගය අයිනේ පිහිටුවා ඇති මුල්ලිවයික්කාල් නාමපුවරුව රූගත කරමින් සිටියදී, ඊට විරෝධය පළ කළ හමුදා භටයින් ඔහුට පහර දී ජංගම දුරකථන දෙකක් උදුරාගෙන ඇති අතර, ලේ ගලන තුවාල සහිතව සිටි ඔහු පොලිසිය විසින් මුලතිව් රෝහලට ඇතුළත් කෙරිණි. ඔහුට පහරදුන් බවට සැක කෙරෙන හමුදා භටයින් තිදෙනෙකු පොලිසිය පසුවදා අත්අඩංගුවට ගෙන අධිකරණය වෙත ඉදිරිපත් කිරීමකින් තොරව එදිනම මුදාහරින ලදි. විශ්වචන්ද්‍රන් රෝහල්ගතව සිට පැමිණි පසු, 30 වැනිදා ඔහුගේ නිවසට පැමිණි පොලිසිය, හමුදා භටයින් උදුරාගත් ජංගම දුරකථන දෙක ඔහුට නැවත ලබා දී ඇත. ඉන් එකකට දැඩි ලෙස හානි සිදු වී තිබූ බව විශ්වචන්ද්‍රන් කියයි. කටු කම්බි එතූ තල් පිත්තකින් විශ්වචන්ද්‍රන්ට පහර දුන් බවට පළ වූ තොරතුරු දැඩි ආන්දෝලනයට ලක් වූ අතර නොවැ. 30 වැනිදා ශ්‍රී ලංකා යුද හමුදාව නිවේදනයක් නිකුත් කරමින් ප්‍රකාශ කළේ, සමස්ත සිදුවීම හමුදාව අපකීර්තියට පත් කිරීමේ අරමුණින් සියුම් ලෙස සැලසුම් කරන ලද්දක් බවයි. තමන්ට කටුකම්බි එතූ තල් පිත්තකින් පහර නොදුන් නමුත් අතින් හා පොල්ලකින් පහර දුන් බවත්, කටුකම්බි වැටට හේත්තු කර ජංගම දුරකථන උදුරා ගැනීමේදී තුවාල සිදු වූ බවත් විශ්වචන්ද්‍රන් ප්‍රකාශ කරයි.

   මූලාශ්‍ර:
   1. webnewslk.com
   2. https://www.army.lk
   3. https://www.tamilguardian.com

## නීතිමය කොන්දේසි

**මාධ්‍ය නිදහසට අදාළව නීතිමය කොන්දේසි පිළිබඳ සංරචකය යටතට ගැනෙන සිදුවීම් 9ක් ඔක්තෝබර්-නොවැම්බර් දෙමස තුළ නිරීක්ෂණය විය. ඉන් 6ක්ම පැරණි සිදුවීම්වලට අදාළ වර්ධනයන් වන අතර ලසන්ත වික්‍රමතුංග ඝාතනය පිළිබඳව ජාත්‍යන්තර මහජන විනිශ්චය සභාවක් ඉදිරියේ නඩු විභාගයක් ආරම්භ වීම, 'මාධ්‍යවේදීන්ට එරෙහි අපරාධවලදී දණ්ඩමුක්තිය'ට එරෙහි අරගලය ශක්තිමත් කරන සාධනීය අවස්ථාවකි. නඩු පැවරීමකින් තොරව මාස 18ක් රඳවාගෙන සිටි අහ්නාෆ් ජසීම් කවියාට එරෙහිව අධිචෝදනා ගොනු කිරීමේදීද ඔහුගේ අයිතිවාසිකම් බරපතළ ලෙස උල්ලංඝනය වී ඇති අයුරු නිරීක්ෂණය විය. අදහස් පළ කිරීමේ අයිතිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් මූලික අයිතිවාසිකම් පෙත්සම් දෙකක් ඉදිරිපත් වීමද සංකේතීය වැදගත්කමක් සහිත මූලික අයිතිවාතිවාසිකම් පෙත්සමක් විභාගයට නොගෙන ප්‍රතික්ෂේප වීමද කැපී පෙනිණි.**

**දිගු කලක් තිස්සේ තහවුරු වී තිබුණු, මළවුන් සැමරීමේ අයිතියට එරෙහිව අධිකරණයෙන් වාරණ නියෝග ලබා ගැනීමේ ප්‍රවණතාව අභියෝගයට ලක් කළ සාධනීය අධිකරණ තීරණයක් පිළිබඳව මුලතිව් මහේස්ත්‍රාත් අධිකරණයෙන් වාර්තා විය.**

**3 වගුව: 2021 ඔක්තෝබර් - නොවැම්බර්: නීතිමය කොන්දේසි - සිදුවීම් 09**

| අංකය | දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | නීතිමය ක්‍රියාමාර්ග | 08 |
| 02 | නීති ප්‍රතිසංස්කරණ යෝජනා | 01 |
| 03 | මාධ්‍යවේදීන්ට එරෙහි අපරාධවලදී දණ්ඩමුක්තිය | 01 |
| | **එකතුව** | **10** |

1. **ලසන්ත වික්‍රමතුංග ඝාතනය ඇතුළුව මාධ්‍යවේදීන් තිදෙනෙකුගේ ඝාතන සම්බන්ධයෙන් 'මාධ්‍යවේදී ඝාතනයන් පිළිබඳ නිත්‍ය මහජන අධිකරණය' විසින් ආරම්භ කෙරෙන නඩු විභාගයේ සමාරම්භක සැසිය නෙදර්ලන්තයේ හේග් නුවරදී පැවැත්වීම.**

   ලසන්ත වික්‍රමතුංග, මිගෙල් ඇන්ගල් ලෝපෙස්

වෙලස්කෝ සහ නබිල් අල්-ෂර්බාජි යන මාධ්‍යවේදීන්ගේ ඝාතන සම්බන්ධයෙන් යුක්තිය ඉටු කිරීමට අපොහොසත් වූ බවට ශ්‍රී ලංකාව, මෙක්සිකෝව සහ සිරියාව යන රාජ්‍යයන්ට එරෙහිව ඉදිරිපත්ව ඇති චෝදනා විනිශ්චය කිරීම සඳහා පැවැත්වෙන 'මාධ්‍යවේදී ඝාතනයන් පිළිබඳ නිත්‍ය මහජන අධිකරණයේ' (The People's Tribunal on the Murder of Journalists) ආරම්භක සැසිය නොවැම්බර් 2 වැනිදා නෙදර්ලන්තයේ හේග් නුවර දී ආරම්භ විය.

මාධ්‍ය නිදහස පිළිබඳ ප්‍රමුඛ පෙළේ සංවිධාන වන ෆ්‍රී ප්‍රෙස් අන්ලිමිටඩ් (FPU), දේශසීමා නොමැති වාර්තාකරුවෝ (RSF) සහ මාධ්‍යවේදීන් ආරක්ෂා කිරීමේ කමිටුව (CPJ) විසින් කරන ලද ඉල්ලීමකට අනුව මෙම නඩු විභාගය ආරම්භ කිරීමට නිත්‍ය මහජන අධිකරණය තීරණය කර තිබේ.

මාධ්‍යවේදීන් තිදෙනාගේ ඝාතන සම්බන්ධයෙන් නඩු විභාගය පැවැත්වෙන දින ඉදිරි දින ප්‍රකාශයට පත් කර තිබෙන අතර පළමුව පැවැත්වෙන ලසන්ත වික්‍රමතුංග ඝාතනය සම්බන්ධ නඩු විභාගය 2022 ජනවාරි 12 සහ 13 යන දිනවල පැවැත්වීමට නියමිත ය.

මූලාශ්‍රය: https://ptmurderofjournalists.org

2. **කාව්‍ය සංග්‍රහයක් ලියා පළ කිරීම හේතුවෙන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගෙන මාස 18ක් තිස්සේ රඳවා තබා සිටි අහ්නාෆ් ජසීම් අධිකරණයට ඉදිරිපත් කිරීම.**

කාව්‍ය සංග්‍රහක් ලියා පළ කිරීම මගින් අන්තවාදි අදහස් ප්‍රවර්ධනය කළ බවට චෝදනා කරමින් අත්අඩංගුවට ගෙන රැඳවුම් භාරයේ තබා ගෙන සිටි දෙමළ භාෂා ගුරුවරයෙකු හා කවියකු වන අහ්නාෆ් ජසීම්ට එරෙහිව පුත්තලම මහාධිකරණය ඉදිරියේ අධිචෝදනා ගොනු කොට ඇති අතර එම නඩුව නොවැම්බර් 15 වැනිදා කැඳවන ලදි.

දහ අට මාසයකට අධික කාලයක් නිසි අධිකරණ ක්‍රියාවලියකින් තොරව මෙන්ම නීත්‍යානුකූල නොවන රැඳවුම් නියෝගයක් ද සහිතව CTID භාරයේ රඳවාගෙන සිටින සිය සේවාදායක මුහම්මදු අහ්නාෆ් මුහම්මදු ජසීම්ට එරෙහිව ත්‍රස්ත මර්දන හා විමර්ශන කොට්ඨාශය චෝදනා ගොනු කර තිබෙන්නේ කුමන්ත්‍රණකාරී ලෙස යැයි අහ්නාෆ් ජසීම්ගේ නීතිඥවරයා ලෙස කටයුතු කරන සංජය විල්සන් ජයසේකර චෝදනා කරයි.

අධිචෝදනා ඉදිරිපත් කිරීමේදී සැකකරුට සහ ඔහු වෙනුවෙන් පෙනී ඉන්න නීතිඥවරයාට එය දැනුම් දීම නීතිපති දෙපාර්තමේන්තුවේ වගකීමක් වුවද මෙහිදී එසේ නොකළ බවත්, එය ස්වභාවික යුක්ති මූලධර්ම හා මූලික අයිතීන් උල්ලංඝනය කිරීමක් බවත් නීතිඥවරයා වැඩිදුරටත් අවධාරණය කරයි. අහ්නාෆ් ජසීම් අත්අඩංගුවට ගැනීමට එරෙහිව ඉදිරිපත් කෙරුණු මූලික අයිතිවාසිකම් පෙත්සමක් ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ විභාගයට ගැනීමට නියමිත ය.

මූලාශ්‍රය: http://www.jdslanka.org

3. **1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත නැවත සමාලෝචනයට පත් කළ නිලධාරී කමිටුවේ වාර්තාව ජනාධිපතිවරයා වෙත භාරදීම.**

දේශීය හා ජාත්‍යන්තර තලයේ දැඩි විවේචනයට ලක්ව ඇති ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත නැවත සමාලෝචනය සඳහා ජනාධිපතිවරයා කැබිනට් අනු කමිටුවක් පත්කළ අතර ඒ වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා මෙම නිලධාරී කමිටුව 2021 ජුනි 24 දින පත් කෙරිණ. අදාළ වාර්තාව, එම කමිටුවේ සභාපති, ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම්, කමල් ගුණරත්න විසින් නොවැම්බර් 15 වැනිදා ජනාධිපතිවරයා වෙත භාර දෙන ලදි. වාර්තාවේ අන්තර්ගතය පිළිබඳ කිසිවක් ප්‍රසිද්ධ කර නැත.

ත්‍රස්තවාදය වැළක්වීමේ පනත අහෝසි කර ජාත්‍යන්තර ප්‍රමිතීන්වලට අනුකූල නව ත්‍රස්තවාදයට එරෙහි නීති හඳුන්වා දිය යුතු බව 2019 පෙබරවාරි මාසයේ දී ශ්‍රී ලංකා රජය සමග පැවති සාකච්ඡාවලදී යුරෝපා සංගමය පෙන්වා දුන් අතර එම පනත වෙනුවට ජාත්‍යන්තර මානව හිමිකම් බැඳීම්වලට ගරු කරන නීති සම්පාදනය කිරීමට ශ්‍රී ලංකා රජය කටයුතු කළ යුතු බව හියුමන් රයිට්ස් වොච් සංවිධානයද පෙන්වා දී තිබිණි.

මූලාශ්‍රය: https://www.lankadeepa.lk

4. **කොතලාවල පනතට එරෙහිව පාර්ලිමේන්තු වටරවුමේ පැවති උද්ඝෝෂණයේදී අත්අඩංගුවට ගත් විරෝධතාකරුවන් 5 දෙනාට දින 105කට පසුව ඇප නියම වීම.**

අගෝස්තු 3 වැනිදා පාර්ලිමේන්තුව අසල පැවති උද්ඝෝෂණයට සහභාගි වී සිටියදී අත්අඩංගුවට ගෙන දින 105ක කාලයක් රිමාන්ඩ් බන්ධනාගාර ගත කර සිටි, සිසුජන ව්‍යාපාරයේ කෝෂිලා හංසමාලි, පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ පාලක ලේකම් චමීර කොස්වත්ත, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය මහා ශිෂ්‍ය සංගමයේ සභාපති අමිල සංදීප, අ.වි.ශි.බ.ම. කැඳවුම්කරු වසන්ත මුදලිගේ සහ රජරට විශ්වවිද්‍යාලයේ හේෂාන් හර්ෂණ යන විරෝධතාකරුවන් 5 දෙනා නොවැම්බර් 15 වැනිදා කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයෙන් ඇප මත නිදහස් කෙරිණි. ඒ පසුගිය 11 වැනිදා ඔවුන්ට ඇප ලබා දීමට හෝමාගම මහාධිකරණය දුන් නියෝගය අනුව ය.

උද්ඝෝෂණයේදී මිනී පෙට්ටියක කාඩ්බෝඩ්වලින් තැනූ අනුරුවක් ගිනිබත් කිරීම හේතුවෙන් මහා මාර්ගයට මහා මාර්ගයට රු 179,000ක අලාභයක් සිදු කළ බවට චෝදනා කරමින්, පොලිසිය පොදු දේපළ පනත යටතේ ඔවුන්ට එරෙහිව චෝදනා ගොනු කොට තිබිණි. මේ හේතුවෙන් මහේස්ත්‍රාත් අධිකරණයෙන් ඇප ලබා ගැනීමට නොහැකි වූ අතර බන්ධනාගාරයේදී කොවිඩ් වැළඳීම නිසා ඔවුන් දැඩි ජීවිත අවදානමකටද ලක් විය.

මූලාශ්‍රය: https://www.lankaviews.com

5. **සමාජ ජාල ඔස්සේ අදහස් ප්‍රකාශ කිරීම නිසා අයුක්තිසහගත ලෙස අත්අඩංගුවට ගැනීමෙන් තම මූලික අයිතිවාසිකම් කඩ වූ බවට සඳහන් කරමින් සමාජ ක්‍රියාකාරිකයකු වන චිරන්ත රන්මාල් අමරසිංහ ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කිරීම.**

අදාළ ක්‍රියාවෙන් තම මූලික අයිතිවාසිකම් කඩ වී ඇති බවට ප්‍රකාශ කරන ලෙසද, අත්අඩංගුවට ගත් තම පරිගණක උපාංග ආපසු ලබා දෙන ලෙසට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු බලධාරීන්ට නියෝග කරන ලෙසද, රුපියල් කෝටියක වන්දි මුදලක් අය කර දෙන ලෙසද මෘදුකාංග සංවර්ධකයෙකු වන චිරන්ත අමරසිංහ සිය පෙත්සම මගින් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඉල්ලා සිටී. පෙත්සමෙහි වගඋත්තරකරුවන් ලෙස පොලිස්පති සී.ඩී. වික්‍රමරත්න ඇතුළු හත් දෙනෙකු නම් කොට තිබේ.

2020 නොවැම්බර් 17 වැනිදා චිරන්ත අමරසිංහගේ නිවසට පැමිණි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කණ්ඩායමක්, කොවිඩ් මළ සිරුරු ආදාහනය කිරීම ගැන පළ කළ ෆේස් බුක් සටහනක් සම්බන්ධයෙන් ප්‍රශ්න කොට, ඒ සඳහා භාවිත කළ පරිගණක උපාංග රැගෙන පසුදින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණෙන ලෙස දැනුම් දී තිබිණි. පසුවදා එහි ගිය විට ඔහු අත්අඩංගුවට ගෙන මහේස්ත්‍රාත්වරයා හමුවට ඉදිරිපත් කරන ලදුව ඇප මත මුදා හරින ලදි.

මූලාශ්‍රය: https://www.lankaviews.com

6. **ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ මාස 3කට අධික කාලයක් තිස්සේ රඳවාගෙන සිටින, ලංකා ඊ නිව්ස් වෙබ් අඩවියේ මාධ්‍යවේදී කීර්ති රත්නායක වෙනුවෙන් ශ්‍රේෂ්ඨාධිකරණයෙහි මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කිරීම.**

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් පසුගිය අගෝස්තු 14දා අත්අඩංගුවට ගෙන, මාස තුනක් තිස්සේ රඳවාගෙන සිටීමෙන් සිය මූලික අයිතිවාසකම් කඩ වූ බව ප්‍රකාශ කරන ලෙසද සිදු වූ අගතිය වෙනුවෙන් වගඋත්තරකරුවන්ගෙන් රු. මිලියන 100ක වන්දියක් ලබා දෙන ලෙසද කීර්ති රත්නායක මෙම මූලික අයිතිවාසිකම් පෙත්සමෙන් ඉල්ලා තිබේ.

නොවැම්බර් 10දා ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ ගොනුකර ඇති අංක SCFR 363/2021 දරන මේ පෙත්සම මගින් නීතිපතිවරයා, පොලිසිය භාර ඇමැති සරත් වීරසේකර, එම අමාත්‍යාංශ ලේකම් ජගත් පී. විජේවීර, ආරක්ෂක අමාත්‍යංශ ලේකම් කමල් ගුණරත්න, පොලිස්පතිවරයා, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන්, සීඅයිඩිය භාර නියෝජ්‍ය පොලිස්පති ඩබ්. තිලකරත්න, සීඅයිඩී අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී රොහාන් ප්‍රේමරත්න, තවත් සීඅයිඩී අධ්‍යක්ෂවරයකු වන පොලිස් අධිකාරී රන්දෙනිය, සීසීඩිය භාර නියෝජ්‍ය පොලිස්පති, සීසීඩී අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නන්දන කුමාර ඇතුළු 20 දෙනෙකු වගඋත්තරකරුවන් ලෙස නම් කර ඇත.

7. **කෝට්ටේ නගරසභාවේ බලධාරීන්ගේ පැමිණිල්ලක් මත New Citizen වෙබ් මාධ්‍ය ජාලයේ මාධ්‍යවේදියකු වන සියත් මෙන්ඩිස් වැලිකඩ පොලිසිය විසින් අත්අඩංගුවට ගැනීම.**

නාවල කනත්තේ ස්මාරක ඉවත් කරමින් සිදු කෙරෙන ඉදිකිරීමක් සම්බන්ධයෙන් වාර්තා කිරීම හේතුවෙන් 'සාපරාධී අයුතු ඇතුළත් වීමක්' කළ බවට නගර සභා බලධාරීන් කළ පැමිණිල්ලක් මත නොවැ 10 වැනිදා මෙම අත්අඩංගුවට ගැනීම සිදු කර තිබේ. ඔහු කොටුව මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරන ලදුව, ඇප නියම කෙරිණි.

අදාළ වාර්තාව ඔක්. 28 වැනිදා Voice of Colombo යූ ටියුබ් චැනලයේ පළ කර ඇති අතර, ගැටලුවට තුඩු දී ඇති ඉදිකිරීම්වල දර්ශන මෙන්ම මහජනතාව හා මහජන නියෝජිතයින් පළ කරන අදහස්ද ඊට ඇතුළත් වේ. සියත් වෙනුවෙන් පෙනීසිටි නීතිඥ රජිත කොඩිතුවක්කු ප්‍රකාශ කළේ මහජන යහපත වෙනුවෙන් සිදු කළ වාර්තාකරණයක් හේතුවෙන් මෙසේ අත්අඩංගුවට ගැනීම මාධ්‍යවේදියාගේ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් බවයි.

මූලාශ්‍රය: https://www.youtube.com

8. **උතුරේ යුද්ධය හේතුවෙන් මියගිය හා අතුරුදන්වූවන් වෙනුවෙන් සැමරුම් උත්සව පැවැත්වීම වළක්වාලමින් පුද්ගලයන් 8 දෙනෙකුට එරෙහිව වවුනියාව මහේස්ත්‍රාත්වරයා තහනම් නියෝගයක් නිකුත් කිරීම හා පසුව එම නියෝගය අවලංගු කිරීම.**

මියගිය එල්.ටී.ටී.ඊ සාමාජිකයන් සිහි කිරීම සඳහා සැමරුම් උත්සව සංවිධානය කිරීම ජාතික සමගියට බාධාවක් බව පවසමින් 1979 අංක 15 අපරාධ නඩුවිධාන සංග්‍රහය යටතේ එම වැඩසටහන් තහනම් කරන ලෙස වවුනියාව පොලිසිය විසින් වවුනියාව මහේස්ත්‍රාත් අධිකරණයෙන් කළ ඉල්ලීමක් සැලකිල්ලට ගනිමින් මහේස්ත්‍රාත්වරයා විසින් මෙම නියෝගය නිකුත් කර තිබිණ.

දෙමළ ජාතික සන්ධාන හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ශිවශක්ති ආනන්දන්, යුද්ධයෙන් අතුරුදන්වූන් පිළිබඳ සංගමයේ සභාපති කේ. ජයවනිතා, එම සංගමයේ ලේකම් ගෝපාල්ක්‍රිෂ්ණන් රාජ්කුමාර්, හිටපු පළාත් සභා මන්ත්‍රී පී. සත්‍යලිංගම්, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී එස්. ශිවමෝහන්, අතුරුදහන්වූවන්ගේ සංගමයේ සාමාජිකයින් වන ගජන් ගජේන්ද්‍රන්, සෙල්වනායගම් අරවින්දන්, සුබ්‍රමණියම් තවබාලසිංහම් යන අයට මෙම තහනම් නියෝගය පනවා තිබිණ.

එහෙත් නොවැම්බර් 25 වැනිදා විත්තිකරුවන්ගේ

නීතිඥවරුන් විසින් කළ අභියාචනයක් සලකා බැලූ මහේස්ත්‍රාත්වරයා, මළවුන් සැමරීම පුරවැසියන්ගේ අයිතියක් බවත්, තහනම් සංවිධානයක සංකේත කිසිවක් ප්‍රදර්ශනය කිරීමෙන් තොරව එම සැමරුම් සිදු කිරීමට බාධාවක් නොමැති බවත් තීන්දු කොට අදාළ නියෝගය අවලංගු කර තිබේ.

වාරණ නියෝගය අවලංගු කිරීමේ තීරණයට එරෙහිව නොවැම්බර් 26 වැනිදා මුලතිව්හි පොලිස් ස්ථාන 7ක් යළි අභියාචනයක් ඉදිරිපත් කළ නමුත් මහේස්ත්‍රාත් ටී. සරවනබවන් එම අභියාචනය ප්‍රතික්ෂේප කළේය.

මූලාශ්‍ර: 1. https://www.lankaviews.com

2. https://www.tamilguardian.com

9. **බලහත්කාරයෙන් නිරෝධායනයට යැවීමෙන් සිය මූලික අයිතිවාසිකම් කඩ වූ බවට ලංකා ගුරු සංගමයේ ලේකම් ජෝසප් ස්ටාලින් ගොනු කළ මූලික අයිතිවාසිකම් පෙත්සම ශ්‍රේෂ්ඨාධිකරණය නිෂ්ප්‍රභ කිරීම.**

බලහත්කාරයෙන් නිරෝධායන මධ්‍යස්ථානයකට යැවීමෙන් සිය මූලික අයිතිවාසිකම් කඩ වී ඇතැයි ලංකා ගුරු සංගමයේ ලේකම් ජෝසප් ස්ටාලින් ගොනු කළ මූලික අයිතිවාසිකම් පෙත්සම නොවැම්බර් 22 වැනිදා නිෂ්ප්‍රභ කෙරිණි.

තමන් සාමකාමී උද්ඝෝෂණයක සිටියදී අත්අඩංගුවට ගෙන පසුව කොටුව මහේස්ත්‍රාත් අධිකරණයෙන් ඇප නියම කර තිබියදී බලහත්කාරයෙන් නිරෝධායන මධ්‍යස්ථානයකට යැවීමෙන් හා තම අභිමතයට පටහැනි ලෙස දිගු කාලයක් රඳවා ගැනීමෙන් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වූ බවට තීරණය කරන ලෙස අදාළ පෙත්සම මගින් ඉල්ලා තිබූ අතර එය විභාගය නොගෙන නිෂ්ප්‍රභ කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කළේ ය.

මෙම තීන්දුව ගෙන ඇත්තේ ප්‍රියන්ත ජයවර්ධන, ශිරාන් ගුණරත්න, අර්ජුන ඔබේසේකර යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඬුල්ල විසිනි.

මූලාශ්‍රය: https://www.lankaviews.com

## වෘත්තීයවේදීත්වය

**'වෘත්තීයවේදීත්වය' යන්න මාධ්‍ය නිදහසට අදාළව සලකා බැලෙන වැදගත් සංරචකයකි. මාධ්‍යවේදීන්ට හොඳ අධ්‍යාපනයක් තිබීම, මාධ්‍යවේදීන්ගේ සේවා කොන්දේසි, මාධ්‍යවේදීන් හා කර්තෘ මණ්ඩල ජාත්‍යන්තර මාර්ගෝපදේශ භාවිතය, ස්වයං වාරණය, වෘත්තීය සමිති හා සංගම් මගින් මාධ්‍යවේදීන්ගේ වෘත්තීය ස්වාධිපත්‍යය, තමන්ගේ කාර්යභාරය පිළිබඳව මාධ්‍යවේදියාගේ අවබෝධය යන විභව දර්ශක 6ක් මෙම සංරචකයට ඇතුළත්ය. එයින් දර්ශක කිහිපයක්ම නිෂේධනීය අර්ථයෙන් නියෝජනය වන සිදුවීමක් වාර්තාවට පාදක වන කාල වකවානුව තුළ නිරීක්ෂණය විය. එනම් ජ්‍යෙෂ්ඨ කතුවරයකුගේ ආන්දෝලනාත්මක ප්‍රකාශයකි. සමස්තයක් ලෙස එය, පසුගිය දශක දෙක තුළ ගොඩනැගුණු මාධ්‍ය ප්‍රතිසංස්කරණ පිළිබඳ කතිකාවට සහ සාධනීය ප්‍රයත්නයන්ට ප්‍රතිමුඛ ව සිටී. 'ශ්‍රී ලංකා වරලත් ජනමාධ්‍යවේදී ආයතනය' පිළිබඳ යෝජනාව මාධ්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ සාධනීය අවස්ථාවක් ලෙස සැලකිය හැකිය. සාමූහික එකඟතාවෙන් යුතුව මාධ්‍ය ආචාරධර්ම පද්ධතියක් සකස් කිරීම පිළිබඳව ජනමාධ්‍ය ඇමතිවරයා ඉදිරිපත් කරන අදහසද සාධනීය එකකි.**

**4 වගුව: 2021 ඔක්තෝබර් - නොවැම්බර්: නීතිමය කොන්දේසි - සිදුවීම් 03**

| අංකය | දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | මාධ්‍යවේදීන් හා කර්තෘ මණ්ඩල ජාත්‍යන්තර මාර්ගෝපදේශ භාවිතය/ ස්වයං වාරණය/ වෘත්තීය සමිති හා සංගම් මගින් මාධ්‍යවේදීන්ගේ වෘත්තීය ස්වාධිපත්‍යය/ තමන්ගේ කාර්යභාරය පිළිබඳව මාධ්‍යවේදියාගේ අවබෝධය | 02 |
| 02 | මාධ්‍යවේදීන්ට හොඳ අධ්‍යාපනයක් තිබීම. | 01 |
| | **එකතුව** | **03** |

1. **ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය විසින් හඳුන්වා දෙන ලද ජනමාධ්‍ය ආචාරධර්ම පද්ධතියට වසර 40ක් සපිරීම නිමිත්තෙන් ඔක්. 14 වැනිදා පැවති සම්මන්ත්‍රණයකදී කතුවරයකු විසින් කරන ලද ප්‍රකාශයක් මාධ්‍ය සමාජය තුළ ආන්දෝලනයට ලක් වීම.**

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල නීතිය යටතේ ජනමාධ්‍යවේදීන්ට අවුරුදු දෙකක සිරදඬුවම් පැමිණවීමේ හැකියාව බොහෝ දෙනාගේ විවේචනයට ලක් වී ඇතත් එය වරදක් ලෙස තමා දකින්නේ නැතැයි ඉරිදා ලංකාදීප පුවත්පතේ ප්‍රධාන කර්තෘ හා ශ්‍රී ලංකා කර්තෘ සංසදයේ සාමාජික ආරියනන්ද දොඹගහවත්ත ප්‍රකාශ කළේය.

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය නීතිය අහෝසි කළ යුතු

බව ශ්‍රී ලංකා කර්තෘ සංසදයේ දීර්ඝකාලීන ස්ථාවරය වුවද ඔහු වැඩිදුරටත් පැවසුවේ, තමාද කර්තෘ සංසදයේ සාමාජිකයෙකු වන නමුත් හරි දේ හරි හැටියටත්, වැරදි දේ වැරදි හැටියටත් කියන්නට තමාට හැකි බවයි. 'පුවත්පත් මණ්ඩලය අහෝසි කරන්නැයි කීම පසුපස දේශපාලනයක් තිබෙන බවද, එය එක්කෙනෙකුගේ දෙන්නෙකුගේ වුවමනාවට සිදුවන දෙයක් බව'ද ඔහු ප්‍රකාශ කළේය. කර්තෘ සංසදයේද නියෝජනය සහිතව පුවත්පත් මණ්ඩලයට විකල්පයක් ලෙස ගොඩනැගුණු ස්වයං නියාමන යාන්ත්‍රණය වන ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම ගැන ඔහු කිසිදු සඳහනක් නොකිරීමද විශේෂත්වයකි.

මූලාශ්‍රය: 1. https://www.youtube.com

2. https://anidda.lk

2. **ජනමාධ්‍යවේදීන් සඳහා 'ශ්‍රී ලංකා වරලත් ජනමාධ්‍යවේදී ආයතනය' නමින් නව ආයතනයක් පිහිටුවීමට ජනමාධ්‍ය ඇමති ඩලස් අලහප්පෙරුම ඉදිරිපත් කළ යෝජනාවකට කැබිනට් අනුමැතිය හිමි වීම.**

ජනමාධ්‍ය විෂයය සම්බන්ධයෙන් සහතික පත්‍ර පාඨමාලාවේ සිට උපාධි සහ පශ්චාත් උපාධි මට්ටමේ අධ්‍යයන අවස්ථා සලසා දීමට හැකි වන පරිදි උසස් අධ්‍යාපන පර්යේෂණ සහ පුහුණු ආයතනයක් ලෙස මෙය ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා බව රජය පවසයි.

''ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ පවතින ගැටලු හඳුනාගෙන දේශීය හා අන්තර්ජාතික ශාස්ත්‍රීය ප්‍රමිතීන්ට අනුව ජනමාධ්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රයේ වර්ධනය හා උසස් ප්‍රමිතින් රැකගැනීම සඳහා රාජ්‍ය අනුග්‍රහය සහිත ආයතනයක් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාව හඳුනාගෙන ඇත." යනුවෙන් අදාළ යෝජනාවෙහි දැක්වේ.

මූලාශ්‍රය: enbsl.lk

3. **සාමූහික ප්‍රයත්නයකින් නවීන හා නූතන සමාජයට ගැළපෙන මාධ්‍ය ආචාරධර්ම පද්ධතියක් සකස් කළ යුතු බවට ජනමාධ්‍ය ඇමතිවරයා කළ ප්‍රකාශය.**

"සියලුම මාධ්‍ය සංසද, මාධ්‍ය වෘත්තීය සමිති, ජනමාධ්‍ය අමාත්‍යංශය, ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව හා පුවත්පත් මණ්ඩලය වැනි මේ සියලු දෙනා නිරෝගී සංවාදයක් පවත්වා අපට ගැළපෙන නූතන හා නවීකරණය වූ ආචාරධර්ම සංග්‍රහයක් සාමූහිකව සම්පාදනය කර ගතයුතු" යැයි ජනමාධ්‍ය ඇමති ඩලස් අලහප්පෙරුම ප්‍රකාශ කළේය. එහිදී ප්‍රකාශනයේ නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදයේ සිද්ධාන්ත ආරක්ෂා කිරීමට සියලු දෙනා කටයුතු කළ යුතු බවත්, ඇමතිවරයා අවධාරණය කළේය.

ඔහු මේ බව ප්‍රකාශ කළේ ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය විසින් හඳුන්වා දුන් ආචාරධර්ම පද්ධතියට අවුරුදු 40ක් පිරීම නිමිත්තෙන් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තු පරිශ්‍රයේ නොවැ. 14දා පැවති සැමරුම් උත්සවයට එක්වෙමිනි.

මූලාශ්‍රය: https://sinhala.news.lk

**5 වගුව: මාධ්‍ය නිදහස: 2021 ජනවාරි - නොවැම්බර් දක්වා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය වෙත වාර්තා වී ඇති සිදුවීම්.**

| **ආවරණය කර ඇති සංරචකය** | **2021 ජනවාරි - සැප්තැම්බර්** | | **2021 ඔක්තෝබර් - නොවැම්බර්** |
|---|---|---|---|
| | පෙර සිදුවීම් | පෙර සිදුවීම්වල වර්ධනයන් | |
| ආරක්ෂාව හා සුරක්ෂිතබව | 42 | | 08 |
| නීතිමය කොන්දේසි | 40 | 05 | 09 |
| මාධ්‍ය ස්වාධීනත්වය | 02 | | - |
| මාධ්‍ය නිදහස සම්බන්ධ ප්‍රවණතා | 01 | | - |
| ව්‍යුහාත්මක කොන්දේසි | 09 | | - |
| වෘත්තීයවේදීත්වය | - | | 03 |

2021 මාධ්‍ය නිදහස මාසික වාර්තා ජනවාරි සිට සැප්තැම්බර් දක්වා මෙතැනින් බලන්න

**පසුසටහන:** සිවිල් සමාජ අපේක්ෂාවන්, ජාතික හා ජාත්‍යන්තර නඩු තීන්දු සහ අන්තර්ජාතික ප්‍රඥප්තීන්ටද අනුව යමින්, මාධ්‍ය නිදහස යනු මානව අයිතියක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. සෑම තැනැත්තකුම සතු සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ නිදහස සහ ආගමික නිදහස මෙන්ම අන් තැනැත්තන්ගේ මත දැනගැනීමට තිබෙන මූලික අයිතිය බාධාවකින් තොරව භුක්තිවිඳීම මානව අයිතියකි. මෙම පදනම මත පිහිටා මාධ්‍ය නිදහස යනු පහත දැක්වෙන දසවැදෑරුම් සංඝටකවල එකතුවක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සලකයි. (1) සිතීමේ නිදහස (2) මතයක් දැරීමේ නිදහස (3) භාෂණයේ නිදහස (4) සාමකාමීව රැස්වීමේ නිදහස ඇතුළු අදහස් පළ කිරීමේ නිදහස (5) තොරතුරු දැනගැනීමේ නිදහස (6) ශ්‍රව්‍ය, දෘශ්‍ය පටිගත කිරීමේ සහ වාර්තා තබා ගැනීමේ නිදහස (7) ප්‍රකාශනයේ නිදහස (8) පුවත්පත් නිදහස (9) විද්‍යුත් මාධ්‍ය නිදහස (10) අන්තර්ජාල නිදහස යනු එම සංඝටකයන්ය. මෙම සංඝටක අතර ඇත්තේ සහජීවී සම්බන්ධයක් වන අතර එක් සංඝටකයක ඇති වන සීමාවන් මාධ්‍ය නිදහස පිළිබඳ අනෙක් සියලුම සංඝටකයන් භුක්තිවිඳීමේ නිදහස අහුරන බව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. එමෙන්ම වගකීම් විරහිතව හා වෛරී සහගත ලෙස එම නිදහස භාවිත කිරීම යහපත් භාවිතාවක් නොවන බවද නිදහස් මාධ්‍ය ව්‍යාපාරය අවධාරණය කරයි.

මෙම මාසික වාර්තා පිළියෙල කරනු ලබන්නේ ජනමාධ්‍ය වාර්තා සහ නිදහස් මාධ්‍ය ව්‍යාපාරයට ලබා ගත හැකි තොරතුරු අනුව වැඩිදුර තොරතුරු සොයා එම සිදුවීම් විශ්ලේෂණය කිරීමෙනි. මෙම විශ්ලේෂණයේදී නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ඉහත කී දසවැදෑරුම් මාධ්‍ය නිදහස් සංඝටකයන් ආවරණය කරන ජාත්‍යන්තරව පිළිගත් සංරචකයන් හතක් ඔස්සේ තෝරා ගත් නිර්ණායක භාවිත කරයි.


## Free Media Movement

Convener | Seetha Ranjanee +94 77 731 2460 | Secretary | Lasantha De Silva +94 71 166 7938
Treasurer | Thaha Muzammil +94 77 374 1026
No 96, Bernard Soysa Mw, Colombo 05. Tel: +94 112368895 Fax: +94 112368895;
Web: www.fmmsrilanka.lk, www.mediareform.lk
Email: fmmsrilanka@gmail.com | Facebook: https://www.facebook.com/fmm.srilanka
Twitter: https://twitter.com/FMMsrilanka | #FMM25